**පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තෝබර් 25 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබිය යුතු මුදල් ප්‍රවාහ පිළියෙල කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඇමුණුම් සමඟ ඉදිරිපත් කළ යුතුය. | 2018 වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය වැරදීමකින් ඇතුළත් කර නොතිබුණි. එසේ වුවත්, පසුව ඔබ වෙත යවා තිබුණි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සුළු ණය හිමි ගිණුමේ සලසා තිබූ ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීම් රු.54,000 ක් සමාලෝචිත වර්ෂයේ සිදු නොවූ නමුත් 2018 දෙසැම්බර් 31 දින ආයුර්වේද තොගයේ පැවති තොගයක් ලෙස හෙළිදරව් කර තිබුණි. | මිලදි ගැනීමෙන් පසුව තොගයට ගත යුතුය. | රු.54,000 ක් වැය විෂයය 203(1) යටතේ සටහන් කර සුළු ණයහිමි ගිණුමට ගිණුම්ගත කර තිබූ නමුත්. අදාළ මූල්‍ය වර්ෂයේ බෙහෙත්වලින් එක් කොටසක් නොලැබීම නිසා තොග ලෙස නොදැක්වීම වරදකි. එසේ වුවත්, මෙම රු.54,000 ක් වටිනා බෙහෙත් තොග 2019 මූල්‍ය වර්ෂයේ සම්පූර්ණයෙන් |

| | | | |
|---|---|---|---|
| | | | භාවිතා කර තිබුණු බව දැනුම් දෙමි. |
| (ii) | අවසන් නොකළ පසුගිය කාල මූලධන වැඩසටහන්වල මුළු එකතුව රු.4,480,868 ක් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස හෙළිදරව් කිරීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා වූ ස්ථාවර වත්කම් මෙම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | කාර්යයන් ඉටු කිරීමෙන් පසුව පමණක් වත්කම්වලට ගෙන ආ යුතුය. | අවසන් නොකළ රු.4,480,868 ක වත්කම්වලින් රු.2,000,000 ක් වටිනා කාර්යයන් 2015 වර්ෂය වනවිට නිම කර තිබුණි. තවද, රු.475,000 ක් වටිනා සෝරන්පත්තු කොත්තික්කුල සුසාන භූමි කාර්යය ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් වත්කම්වලින් ඉවත් කර නොතිබුණි. අනෙකුත් ඒවා වත්කම් ගිණුම්වලින් ඉවත් කර ඇත. |
| (iii) | රු.48,062,794 ක් වටිනා ගොඩනැගිලි මෙම සභාව විසින් පවරා ගෙන භාවිතා කරමින් තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ ඇතුළත් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් මෙම වටිනාකමෙන් අඩුවෙන් දැක්වුණි. | පවරා ගැනීමෙන් පසුව ගිණුම්ගත කළ යුතුය. | වත්කම්වලට නොගත් රු.48,062,794 ක් වටිනා ගොඩනැගිලි ස්ථාවර වත්කම් ගිණුමට ජ'නල් සටහන් මඟින් දැන් වත්කම්වලට ගෙන ඇත. |
| (iv) | පසුගිය වර්ෂවල ඉටු නොකළ මූලධන වැඩසටහන් 06ක මුළු එකතුව රු.4,477,868 ක් අදාළ වර්ෂවල සුළු ණයහිමියන් ලෙස දක්වා ප්‍රතිපාදන වෙන්කර තිබීමෙන් අදාළ වටිනාකම් එම වැඩසටහන් නිම නොවුනත්, මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස හෙළිදරව් කර තිබුණි. | වැඩසටහන් සම්පූර්ණයෙන් නිම වූ පසුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වේ. | ඉටු නොකළ වැඩසටහන් 06 කින් මුළු එකතුව රු.4,477,868 ක් සුළු ණය හිමි ගිණුමට ගිණුම්ගත කර සෝරන්පත්තු කොත්තික්කුලම් ඉදිකිරීම සඳහා රු.475,000 ක් සහ ඒ වන විටත් ඉටුකළ රු.2,000,000 මුගමාලෙයි ආයුර්වේද ගොඩනැගිල්ල හැර ඉටු නොකළ කාර්යයන් සඳහා ප්‍රතිපාදන වත්කම් ගිණුමෙන් ඉවත් කර ඇත. |
| (v) | පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල ඉදිකළ ගොඩනැගිලිවල මුළු එකතුව රු.48,062,794 ක් අදාල සභාව විසින් පවරාගෙන භාවිතා කරනු ලබන නමුත් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර | ස්ථාවර වත්කම් වල ගිණුම්ගත කළ යුතුය. | පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ ඉදිකළ ගොඩනැගිලි 4 හි වියදම් රු.48,062,794 ක් දැන් ස්ථාවර වත්කම්වලට එකතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | වත්කම් හි ඇතුළත්ව නොතිබූ බව නිරීක්ෂණය විය. | | |
| (vi) | බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වූ වියදම වවුචර් අංක 905 මඟින් 2018 දෙසැම්බර් 31 දින සුළු ණයහිමියෝ ගිණුම්/ත කර තිබුණි. එසේම බෙහෙත් ද්‍රව්‍ය නොලැබී තිබූ නමුත් ආයුර්වේද තොගයේ පැවති තොගයට රු. 54,000ක් එකතු කර තිබුණි. | භාණ්ඩ ලැබීමෙන් පසුව පමණක් මුදල් ගෙවිය යුතුවේ. | දැනට මෙම බෙහෙත් තොග ලැබී සම්පූර්ණයෙන් භාවිතා කර තිබුණු බව දැනුම් දෙමි. |
| (vii) | රු.520,000 ක් වටිනා සැපයුම් සහ සේවා 04 ක් නියමිත වේලාව තුළ ලබා නොදීමෙන් ප්‍රතිපාදන සැලැසීම සුළු ණයහිමියන්ට මාරු කර තිබුණි. | නියමිත කාලය තුළ භාණ්ඩ හා සේවාවන් සැපයීමට ක්‍රියා කළ යුතුය. | 2018 වර්ෂයේ නොලැබීම නිසා සුළු ණයහිමියන් යටතේ ගිණුම්ගත කරන ලදී. අදාළ භාණ්ඩ හා සේවාවන් සියල්ල දැන් ලැබී නිරවුල් කිරීම් ද කර ඇත. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් 08 ක් නියමිත කාලයේදී කොන්ත්‍රාත් පිරි නැමීමට කටයුතු නොකිරීම නිසා වැඩසටහන් සඳහා වූ ප්‍රතිපාදන එකතුව රු.9,634,565 ක් සුළු ණය හිමියන්ට මාරු කර තිබුණි. | නියමිත කාලයේදී කොන්ත්‍රාත් පිරි නැමීමට කටයුතු කර කර්මාන්තයත් අවසන් කළ යුතුය. | රු.475,000 ක් වටිනා සෝරන්පත්තු කෝත්තික්කුල සුසාන භූමියේ කාර්යයන් හැර අනෙකුත් කාර්යයන් අවසන් කර තිබුණි. |

**1.4 අනුකූල නොවීම්**

--------------------

**1.4.1 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

----------------------------------------------------

| | නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ---------------------- | -------------------- | ---------------- | -------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 891(1) | ඇප තැන්පත් කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාකළ යුතුය. | ඇප මුදල් ලේඛනය වර්තමානයේ සියළුම විස්තර ඇතුළත්ව පවත්වාගෙන යනු ලැබේ. |
| (ii) | මුදල් රෙගුලාසි881 | සේවක ඇප මුදල් පත්වීම් දින සිට මාස 02 | අදාළ මුදල් රෙගුලාසිවලට | ඉදිරියේදී මාස 02 ක් ඇතුළත අයකිරීමට කටයුතු කරනු |

| | | | | |
|---|---|---|---|---|
| | | ක් තුළ අයකර ගෙන නොතිබීම. | අනුකූලව ක්‍රියාකළ යුතුය. | ලැබේ. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ කල් ඉකුත් වූ කොන්ත්‍රාත් ඇප තැන්පතු 05 සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාකළ යුතුය. | වර්ෂ 02 ක් ඉක්ම වූ කල් ඉකුත් වූ කොන්ත්‍රාත් ඇප තැන්පත් 05ක් වූ කලී ස්කලෙට් ඉංජිනියරින් ආයතනයට එරෙහිව නඩු විභාග වෙමින් පවතින නිසා නිරවුල් කළ නොහැකි විය. |
| (ආ) | පළාත් මූල්‍ය රීති 163.3 | අත්තිකාරම් 15 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | පළාත් මූල්‍ය රීතීන්ට අනුව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. එසේම, 2019.04.31 දින දක්වා රු.53,363,131 ක් වූ අත්තිකාරම් නිරවුල් කර තිබුණි. |

**1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුද්දර ගාස්තු පනත අනුව සේවක වැටුපෙන් අයකළ එකතුව රු.22,575 ක මුද්දර ගාස්තු ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | නියමිත කාලයේදී ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. | මුද්දර ගාස්තු ආදායම් බදු දෙපාර්තමේන්තුවට යැවීමට වවුචර් පත් සකස් කර දැනට ගෙවීම් සිදු කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.21,215,468 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු.16,471,037 ක් විය.

### 2.2 මූල්‍ය පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබූ මුද්දර ගාස්තු රු.7,985,805 ක් මාස 03 කට අධික කාලයක් බැංකුවේ ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි. | නියමිත කාලයේ ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. | මුද්දර ගාස්තු ඇතුළත්ව රු.මිලියන 805 ක් දැනට ලංකා බැංකු ශාඛාවේ ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කර ඇති අතර අදාළ අරමුදල් සඳහා වූ කර්මාන්තයන් ආරම්භ කර ඇත. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| (ii) | කුලී | 3,458,724 | - | 4,395,050 | 332,510 | 4,101,356 | - | 4,193,279 | 657,445 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 925,500 | - | 2,219,769 | 8,200 | 760,550 | - | 1,306,540 | 3,200 |
| (iv) | වෙනත් ආදායම් | 8,670,500 | - | 22,084,652 | 4,935,862 | 8,560,300 | - | 17,137,467 | 4,751,686 |
| | | **13,054,724** | **-** | **28,699,471** | **5,276,572** | **13,422,206** | **-** | **22,637,286** | **5,412,331** |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව එහි ආදායම් ලැයිස්තු ගත කර රැස්කිරීම සඳහා අවශ්‍ය ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට පසුගිය වර්ෂ 10 ක සිට කටයුතු කර නොතිබුණි. | ආදායම් ලැයිස්තු ගත කර අයකිරීමට කටයුතු කළ යුතුය. | සභාව දැනට දේපල බදු අයකිරීම සඳහා සංවර්ධනය වූ ප්‍රදේශයක් ලෙස ප්‍රසිද්ධි කර ඇත. |
| (ආ) | අයවැය ඇස්තමේන්තු නිවැරදි අයුරින් සකස් නොකිරීමත්, ඇස්තමේන්තු නිවැරදි ආකාරයට සැලසුම් පිළියෙල නොකිරීමෙන් ඇස්තමේන්තුගත ආදායමත් තථ්‍ය ආදායමත් අතර රු.8,200 සිට රු.4,935,862 ක් දක්වා වෙනස්කම් පැවතුණි. | සුදුසු ආකාරයට අයවැය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී නිවැරදි ආකාරයට සැලසුම් සකස් කර අයවැය පිළියෙල කරනු ලැබේ. |
| (ඇ) | ඉඩම් බදු හා බදු කුලී හිඟ රු.190,735 ක් පසුගිය වර්ෂ 04 සිට වර්ෂ 07 කට අධික කාලයක සිට අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. | ඉඩම් බදු හා බදු කුලී හිඟ මුදල් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |

**2.3.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුලී ආදායම් අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 138 ක් වුවද, අයවැය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. ඇස්තමේන්තුගත කුලී ආදායමට වඩා තථ්‍ය කුලී ආදායම් සියයට 138 ක් වීමෙන් අයවැය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අයවැය ඇස්තමේන්තු විධිමත් අයුරින් සිදුකළ යුතුය. | තාවකාලික කුලී ආදායම්වලින් ආදායම වැඩි වී තිබුණි. ඉදිරි කාලයේදී මේවා ද සැලකිල්ලට ගෙන අයවැය පිළියෙල කරනු ලැබේ. |

**2.3.4 අනෙකුත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනෙකුත් ආදායම් අයවැයගත ආදායමෙන් සියයට 314 ක් වූ අතර අයවැය ඵලදායී පාලන කාරකයක් ලෙසට යොදාගෙන නොතිබීම හෙළිදරව් කෙරුණි. | අයවැය නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය. | අපේක්ෂා නොකළ ආදායම් ලැබූ බැවින් තථ්‍ය ආදායම් වැඩිවීම සිදු විය. |

**2.3.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභා ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට රු.3,200,000 ක් උසාවි දඩ මුදල් සහ රු.1,712,317 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු උතුරු පළාත් මූල්‍ය පනත ප්‍රකාරව ඊළඟ මූල්‍ය වර්ෂයේ ලැබෙනු ඇත. එසේම, 2020 මූල්‍ය වර්ෂයේ සිට අයවැයෙන් නිවැරදිව අයකිරීමට හැකි වන පරිදි අයවැය ඇස්තමේන්තු සකස් කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, මූලික කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබිය යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් කිසිඳු කාරණාවක් සඳහා අතුරු ව්‍යවස්ථාව සකස් කර නොතිබුණි. | නියමිත අතුරු ව්‍යවස්ථා අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. | අප ප්‍රාදේශීය සභාවට අතුරු ව්‍යවස්ථා සැකසීමේ අවශ්‍යතාවයක් මේ දක්වා ඇති නොවීමෙන් කිසිඳු අතුරු ව්‍යවස්ථාවක් සකස් කර නොතිබුණි. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලයේදී සකස් කිරීමට කටයුතු කළ යුතුය. | 2019 වර්ෂය සඳහා සකස් කර ඇත. |

**(ඇ) අපේක්ෂිත ප්‍රතිඵල (output) අත් කරගැනීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යෝජිත සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් 06 ක කාර්යසාධනය වෙනුවෙන් එකතුව රු.650,700 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නමුත් අපේක්ෂිත ප්‍රතිඵල අත් කරගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඩෙංගු මර්ධනය සඳහා සලසා තිබූ ප්‍රතිපාදනය ඇප මුදල් මාරුකිරීම මඟින් ඩෙංගු මර්ධන ඉන්ධන සඳහා භාවිතා කර තිබුණි. අනෙකුත් ඒවා හදිසි අවශ්‍යතා සඳහා සලසා තිබුණි. එවැනි අවශ්‍යතා මතු නොවීමෙන් වියදම් සිදුකර නොතිබුණි. |

(ඈ) අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) අත් කරගැනීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ නමුත් සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයන්හි NELSIP ව්‍යාපෘතිය යටතේ රු.16,693,945 ක් වැයකිරීම මඟින් පලෙයි කඩ කාමර සංකීර්ණයේ ඉහළ මහලේ සංස්කෘතික මධ්‍යස්ථානය සහ ඉයක්කච්චි වෙළඳපොල සංකීර්ණයන් ඉදිකර තිබූ නමුත්, අපේක්ෂිත තත්ත්වයේ ප්‍රතිලාභ සභාවට අත් කර ගත නොහැකි විය. | ගොඩනැගිලි භාවිතා කර සංවර්ධන ප්‍රතිලාභ අයකර ගත යුතු වේ. | පලෙයි කඩ සංකීර්ණ මධ්‍යස්ථානය අලංකරණය කර ආදායම් වැඩි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. එසේම, සභාවේ අවශ්‍යතාවයන්ටත් භාවිතා කෙරේ.<br>ඉයක්කච්චි වෙළඳපොලේ ලබා දී නොතිබුණු කඩ කාමර ලබා දීම සඳහා අවශ්‍ය තීරණ ගෙන ඇති අතර 2019.09.27 දින පුවත්පත්වල දැන්වීම සඳහා කටයුතු කර ඇත. |

(ඉ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බෙහෙත් අපද්‍රව්‍ය පුත්තලම සිමෙන්ති සංස්ථාවට ලබා නොදී සභාවේ කසළ බැහැර කිරීමේ බිමට බැහැර කරන නිසා පාරිසරික හානි සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | පාරිසරික හානි සිදු නොවන අයුරින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවිය යුතුය. | අප ප්‍රාදේශයේ වෛද්‍ය ශාලාව සමඟ සම්බන්ධ වී දැනට අපද්‍රව්‍ය බැහැර කිරිම නවතා ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහජනතාවට සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු සහ පනවනු ලබන දඩ මුදල්, ඝන අපද්‍රව්‍ය ගාස්තු, කුලී ගාස්තු, බදු අයකිරීම් පිළිබඳව නීතිමය එකඟතාවය ලබාගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ කිසිදු ගැසට් නිවේදනයක් අදාළ සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | නීතිමය එකඟතාවය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | අයකිරීම්, ගාස්තු පැනවීම් පිළිබඳව 2020 මූල්‍ය වර්ෂය සඳහා පල කිරීමට කටයුතු යොදා ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුරප්පාඩුව පවතින සේවක පුරප්පාඩු 13 පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය සෞඛ්‍ය කම්කරු සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය. අනෙකුත් පුරප්පාඩු පිරවීමේ ලිපි අදාළ අනුමැතිය සඳහා යවා ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් කඩ කාමර දීර්ඝ කාලීන බදු දීම මඟින් සභාව ආදායම් උපයා ගන්නා නමුත් අත්සන් කරනු ලැබූ ගිවිසුම් අනුව කුලී කාලානුරූපීව සමාලෝචනයට ලක් කර කුලිය තීරණය කරනු ලබන බව සඳහන් වුවත්, පසුගිය වර්ෂයේ හෝ සමාලෝචිත වර්ෂයේ කිසිදු සමාලෝචනයක් කර නොතිබුණි. | සමාලෝචනයන් නියමිත කාලවලදී සිදු කළ යුතු වේ. | සභාවට අයත් කඩ කාමර 2015 වර්ෂයේදී බදු තක්සේරු කර තිබූ නිසා 2020 වර්ෂයේදී නැවත තක්සේරු කිරීමට නියමිතය. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. | ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව ලේඛනගත කරමින් පවතී. |

**3.5.2 වාහන භාවිතය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව සතුව භාවිතයේ පවතින | වාහන උපරිම අයුරින් | වාහන 02 ක් අලුත්වැඩියා කර |

| | | | |
|---|---|---|---|
| | වාහන 06 ක් භාවිතා කළ හැකි තත්ත්වයට මාරු කර නොතිබුණි. | භාවිතා කළ යුතුය. | ඇත. වාහන 04 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | සභාවේ භාවිතය සඳහා සභාවට පසුගිය කාලවල පරිත්‍යාග කරනු ලැබූ වාහන 05 ක් මේ දක්වා සභාවට පවරාගෙන නොතිබුණි. | අයිතිය මාරු කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ඇ) | සභාව විසින් water bowser 03 ක් සහ Trailer භාවිතා කරනු ලබන නමුත් මේ දක්වා ලියාපදිංචි කර නොතිබුණි. | වාහන ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කළ යුතුය. | ලේඛන නොමැති වීමෙන් ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබේ. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු.19,908,532 ක් නිෂ්පාදන ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණත්, ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රසම්පාදන සැලැස්ම 2019 මූල්‍ය වර්ෂය සඳහා පිළියෙල කර ඇත. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කළ බලපත්‍ර හා පාරිසරික බලපත්‍ර මත ඇස්තමේන්තුගත ආදායම රු.434,500 කි. එසේ වුවත්, තථ්‍ය ආදායම රු.835,464 ක් වූ හෙයින් සභාව, සභා බල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර බලපත්‍ර ලබාගත හැකි තාවකාලික ව්‍යාපාරික ආයතන අයවැය ඇස්තමේන්තුවට | අයවැය විධිමත් අයුරින් පිළියෙල කර ඵලදායී පාලන කාරකයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | 2020 මූල්‍ය වර්ෂයට අදාළ අයවැය, ඇස්තමේන්තුගත ආදායම් විස්තර සහිතව පිළියෙල කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත් නොකිරීමෙන් අයවැයගත ආදායමට වඩා තථ්‍ය ආදායම සියයට 92 කින් වැඩි වී තිබුණි. | | |
| (ආ) | ඉඩම් කුලී සහ ව්‍යාපාරික ස්ථාන පිළිබඳ ඇස්තමේන්තුගත ආදායම් රු.843,224 ක් වුවත්, තථ්‍ය වශයෙන් රු.1,287,624 ක් විය. මෙය ඇස්තමේන්තුගත ආදායමට වඩා තථ්‍ය ආදායමේ සියයට 50 ක වැඩිවීමකි. | අයවැය විධිමත් අයුරින් පිළියෙල කර ඵලදායී පාලන කාරකයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී ආදායම් නිවැරදිව තක්සේරු කර ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ. |